# ශ්‍රී ලංකාවේ පිරිවෙන් හා ආරාමික පුස්තකාලයන්හි බෞද්ධ සාහිත්‍යය දැනුම සංවිධානය කිරීම සහ ඒවායේ වත්මන් තත්ත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ආර්.කේ.ඒ. චතුරංග[1], එච්.එම්. උදාර ඉදුනිල්[2]**

## හැඳින්වීම

ශ්‍රී ලාංකීය සංස්කෘතිය, ඓතිහාසික ශිෂ්ටාචාරය සහ අනන්‍යතාව හැඩගැස්වීමෙහිලා බුදුදහම සහ සඟ පරපුර සතු වූයේ අද්විතීය හා නොමැකෙන බලපෑමකි. ශතවර්ෂ ගණනාවක් පුරා මෙරට දේශීය දැනුම් පද්ධතිය සහ බෞද්ධ සාහිත්‍ය වාචිකව මෙන්ම ලේඛනගතව පරපුරෙන් පරපුරට දායාද කිරීමේ ප්‍රධාන තොරතුරු කේන්ද්‍රස්ථානය සහ අධ්‍යාපනික කේන්ද්‍රය බවට පත්වූයේ විහාරස්ථානයයි. විශේෂයෙන්ම, පිරිවෙන් හා ආරාමික පුස්තකාල, මෙරට ප්‍රාථමික තොරතුරු මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කරමින්, ත්‍රිපිටක ධර්මය, අටුවා, ටීකා, ප්‍රකරණ වැනි ශුද්ධ වූ ආගමික ග්‍රන්ථ පමණක් නොව දේශීය වෛද්‍ය විද්‍යාව (ආයුර්වේදය සහ හෙළ වෙදකම), ජ්‍යෝතිෂ්‍යය, වාස්තු විද්‍යාව, කෘෂිකර්මාන්තය, සත්ව විද්‍යාව සහ ඉතිහාසය වැනි විවිධ ලෞකික ක්ෂේත්‍රයන්ට අයත් පුස්කොළ ග්‍රන්ථ සහ ඓතිහාසික ලේඛන සුරක්ෂිතව තබාගැනීමට සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත.

නූතන පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයේ බටහිර මූලධර්ම සහ වර්ගීකරණ රීති විධිමත් වශයෙන් ස්ථාපනය වීමට පෙර සිටම, ශ්‍රී ලංකාවේ පිරිවෙන් හා ආරාමික පුස්තකාලයන්හි දැනුම සංවිධානය කිරීම, සුචිගත කිරීම, සංරක්ෂණය කිරීම සහ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ සාර්ථක, ප්‍රායෝගික සහ විද්‍යාත්මක දේශීය ක්‍රමවේදයන් භාවිත කර තිබේ. කෙසේ වුවද, නූතන ගෝලීයකරණ ප්‍රවණතා, ඩිජිටල් තාක්ෂණයේ ශීඝ්‍ර වර්ධනය, සමාජ-ආර්ථික පරිවර්තනයන් සහ රාජ්‍ය හෝ ආයතනික මට්ටමින් විධිමත් අවධානයක් මෙන්ම මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මෙම සාම්ප්‍රදායික පිරිවෙන් හා ආරාමික පුස්තකාල සහ ඒවා සතු වටිනා අස්පර්ශනීය හා ස්පර්ශනීය දැනුම් සම්භාරය වර්තමානය වන විට දැඩි අවදානමකට ලක්ව ඇත.

ශ්‍රී ලංකාවේ විහාරස්ථාන සතුව අතිවිශාල දේශීය ඥාන සම්භාරයක් සහ වටිනා බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය පවතින නමුත්, ඒවා නූතන පුස්තකාල හා තොරතුරු විද්‍යා මූලධර්මයන්ට සහ ප්‍රමිතිකරණයන්ට (standardization) අනුව විධිමත් වශයෙන් සංවිධානය කර හෝ නඩත්තු කර නොමැත. පිරිවෙන් හා ආරාමික පුස්තකාල බොහොමයක නිසි සූචිකරණ (Cataloging), වර්ගීකරණ (Classification) හෝ සුචිගතකරණ (Indexing) පද්ධති භාවිත නොවීම හේතුවෙන් පරිශීලකයන්ට සහ පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු සහ දුර්ලභ පුස්කොළ පොත් කඩිනමින් හා නිවැරදිව සොයාගැනීම අතිශය දුෂ්කර වී ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ ශ්‍රී

1 kasunchaturanga38@gmail.com

2 පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. induniluudara@gmail.com

ලංකාවේ පිරිවෙන් හා ආරාමික පුස්තකාලයන්හි බෞද්ධ සාහිත්‍යය දැනුම සංවිධානය කිරීම සහ ඒවායේ වත්මන් තත්ත්වය කෙබඳු ද යන්න විමර්ශනය කිරීමයි.

**පර්යේෂණයේ අරමුණු**

- ශ්‍රී ලංකාවේ පිරිවෙන් හා ආරාමික පුස්තකාල සතු බෞද්ධ සාහිත්‍ය සහ දේශීය දැනුම් මූලාශ්‍රවල ව්‍යාප්තිය, විවිධත්වය සහ ස්වභාවය විද්‍යාත්මකව හඳුනාගැනීම.
- තෝරාගත් පිරිවෙන් හා ආරාමික පුස්තකාලවල පවතින භෞතික, කළමනාකරණ සහ තාක්ෂණික වත්මන් තත්ත්වය සහ ඒවා පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ප්‍රධාන ප්‍රායෝගික අභියෝග විශ්ලේෂණය කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදුකරන ලද අතර අරමුණු සහගත නියදිය යටතේ විවිධ පරිසරයන් යටතේ පිරිවෙන් හා ආරාමික පුස්තකාල ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීම සඳහා තෝරාගත් ප්‍රමුඛ සහ ඓතිහාසික විහාරස්ථාන 3ක් තෝරා ගන්නා ලදී. එනම්

- ගොඩගෙදර උත්තරමූල පිරිවෙන් රජමහා විහාර පුස්තකාලය
- නාරංගොඩපාළුව රත්න ශ්‍රී සනාරාම පොත්ගුල් විහාර පුස්තකාලය
- සූරියගම ශ්‍රී නාගර්ජුන විද්‍යාපීඨ මහ පිරිවෙන් පුස්තකාලය

දත්ත රැස්කිරීමේ ක්‍රම වශයෙන් නිරීක්ෂණ ක්‍රමය සහ විහාරාධිපති හිමිවරුන්, පිරිවෙන් පරිවේණාධිපති හිමිවරුන්, පුස්තකාල භාරකාර භික්ෂූන් වහන්සේලා සමග සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කරන ලදී. රැස්කරගත් දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමය යටතේ විශ්ලේෂණය කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

දත්ත විශ්ලේෂණයේදී අනාවරණය වූ පරිදි, තෝරාගත් විහාරස්ථාන ත්‍රිත්වය සතුව වසර සිය ගණනක් පැරණි, අතිශය දුර්ලභ පුස්කොළ පොත් සහ පැරණි මුද්‍රිත ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් පවතී. ඒවා හුදෙක් බෞද්ධ දර්ශනයට පමණක් සීමා නොවී, දේශීය කෙම් ක්‍රම, පාරම්පරික හෙළ වෙදකම, සහ විවිධ ගුප්ත ශිල්ප ශාස්ත්‍රවලට අයත් අනන්‍ය මූලාශ්‍රය වේ. කෙසේ වුවද, මෙම දැනුම කළමනාකරණය කිරීමේදී සහ වත්මන් තත්ත්වය විමසීමේදී ප්‍රධාන ගැටලු කාණ්ඩ 4ක් හඳුනාගැනීමට ලැබුණි.

- **විධිමත් වර්ගීකරණයක් සහ තොරතුරු ප්‍රතිසාධනයක් නොමැතිකම:** ඩීවි දශම වර්ගීකරණය (Dewey Decimal Classification - DDC) වැනි ජාත්‍යන්තර ප්‍රමිතිගත වර්ගීකරණ පද්ධති පිරිවෙන් හා ආරාමික පුස්තකාල භාවිත කිරීම අතිශය දුෂ්කර වී ඇත්තේ බෞද්ධ ධර්මයේ අනුකොටස් (උදා: සූත්‍ර, විනය, අභිධර්මයේ සියුම් බෙදීම්) සහ දේශීය දැනුම සඳහා බටහිර වර්ගීකරණ පද්ධති තුළ ඇති සීමිත ඉඩකඩ සහ නොගැළපීම් හේතුවෙනි. මේ නිසා පර්යේෂකයන්ට නිවැරදි මූලාශ්‍රය සොයාගැනීමට විශාල කාලයක් ගත වේ.

- **දේශගුණික සහ භෞතික පරිසරයේ දුර්වලතා:** නිසි උෂ්ණත්ව පාලනයක් (Temperature Control) හෝ ආර්ද්‍රතා (Humidity) මිනුම් නොමැති සාමාන්‍ය ලී හෝ යකඩ අල්මාරිවල පුස්කොළ පොත් ගබඩා කර තිබීම නිසා වේයන්, කෘමීන් සහ දිලීර මගින් ඒවා ශීඝ්‍රයෙන් දිරාපත් වෙමින් පවතී. සාම්ප්‍රදායික පැඟිරි තෙල් ගැල්වීම ඇතැම් ස්ථානවල සිදුකලද එය අඛණ්ඩව සිදු නොවේ.

- **මානව සම්පත් සහ වෘත්තීය පුහුණුවක් නොමැතිකම:** පුස්තකාල භාරව කටයුතු කරන භික්ෂූන් වහන්සේලාට හෝ ස්වේච්ඡා සේවකයන්ට පුස්තකාල හා තොරතුරු විද්‍යාව හෝ ලේඛනාගාර කළමනාකරණය පිළිබඳ කිසිදු විධිමත් පුහුණුවක් නොමැති වීම පාලන කටයුතු සම්පූර්ණයෙන්ම අඩාල වීමට හේතු වී ඇත.

- **ඩිජිටල්කරණයේ සහ තාක්ෂණයේ මන්දගාමී බව:** විහාරස්ථානවල පවතින මූල්‍ය අපහසුතා සහ විශේෂිත Scanners හෝ ඩිජිටල් කැමරා නොමැතිකම නිසා, ඩිජිටල් සංරක්ෂණ (Digital Preservation) කටයුතු ප්‍රාථමික මට්ටමක හෝ සිදු නොවේ. පවතින දත්ත පද්ධති පවා Metadata ප්‍රමිතීන්ට අනුකූල නොවේ.

## නිගමන

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පන්සල් පුස්තකාල මගින් මෙරට බෞද්ධ උරුමය සහ දේශීය ඥානය රැකගැනීමට කළ ඓතිහාසික මෙහෙය මිල කළ නොහැකි වුව ද, වර්තමානයේ ඒවා පවතින්නේ අතිශය අර්බුදකාරී සහ බිඳවැටීමේ තත්ත්වයකය. මෙම ජාතික උරුමයන් රැකගැනීම සඳහා පහත සඳහන් උපායමාර්ගික විසඳුම් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය:

1. **විශේෂිත බෞද්ධ සහ දේශීය ඥාන වර්ගීකරණ පද්ධතියක් (Specialized Classification Scheme) හඳුන්වාදීම:** පිරිවෙන් පුස්තකාලවලටම ගැළපෙන පරිදි ත්‍රිපිටකය, අටුවා සහ දේශීය දැනුම වර්ගීකරණය කළ හැකි සරල, ප්‍රමිතිගත දේශීය වර්ගීකරණ මාලාවක් LIS ක්ෂේත්‍රයේ සහ විශ්වවිද්‍යාලයීය පර්යේෂකයන් මැදිහත් වී සකස් කළ යුතුය.

2. **පරිගණකගත ජාතික ඩිජිටල් සංරක්ෂණ ගබඩාවක් (National Digital Repository for Temple Literature) පිහිටුවීම:** බෞද්ධ විශ්වවිද්‍යාල සහ ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ඒකාබද්ධ වී පන්සල්වල ඇති පුස්කොළ පොත් උසස් තාක්ෂණයෙන් යුතුව ඩිජිටල්කරණය කර, විවෘත ප්‍රවේශ (Open Access) Online Database එකක් යටතට පත් කළ යුතුය.

3. **අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ:** පිරිවෙන් සහ බෞද්ධ විශ්වවිද්‍යාල අධ්‍යාපන විෂය මාලාවට මූලික පුස්තකාල කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ලේඛන සංරක්ෂණ ක්‍රමවේද (Conservation Techniques) අනිවාර්ය විෂය පථයක් ලෙස ඇතුළත් කළ යුතුය.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ ආරාමික පුස්තකාල යනු හුදෙක් පොත්පත්

තැන්පත් කර ඇති ගොඩනැඟිලි නොව, අපේ මුළු මහත් ශිෂ්ටාචාරයේම ඥාන විද්‍යාත්මක මුල් පද්ධතියයි. ඒවා නූතන තොරතුරු තාක්ෂණය, පුස්තකාල විද්‍යාත්මක මූලධර්ම සහ ජාතික ප්‍රතිපත්ති සමඟ බද්ධ කර සුරක්ෂිත කිරීම සමස්ත ශ්‍රී ලාංකීය සමාජයේම මතු පරපුර උදෙසා පැවරෙන අත්හළ නොහැකි වගකීමකි.

**ප්‍රමුඛ පද** - පිරිවෙන් පුස්තකාල, දැනුම සංවිධානය , පුස්කොළ පොත්, ඩිජිටල් සංරක්ෂණය, බෞද්ධ සාහිත්‍ය

**ආශ්‍රිත ග්‍රන්ථ**

De Silva, W.A. (1938). *Catalogue of palm-leaf manuscripts in the Library of the Colombo Museum.* Vol. 1. Colombo: Ceylon Government Press.

Gunaratne, A. (2018). *'Traditional methods of preserving palm-leaf manuscripts in monastic libraries of Sri Lanka'*. Journal of the University of Kelaniya. 7(2), pp. 45–58.

Khiste, G.P. and Veer, D.K. (2018). *'Digital preservation of palm leaf manuscripts: Challenges and remedies'*. International Journal of Library and Information Science. 10(4), pp. 46–52.

Seneviratne, W. (2012). *'Architectural evolution and knowledge organization of ancient monastic libraries in Anuradhapura period'*. Sri Lanka Library Review. 26(1), pp. 12–29.

Wijayawardhana, G. and Amarasiri. M.S. (2021). *'Adapting standard classification systems for Buddhist literature.* A critical review of DDC in Sri Lankan libraries'. Journal of National Library Science. 14(3), pp. 89–104.